Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**08 ශ්‍රේණිය** **චිත්‍ර කලාව** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

---

## I කොටස

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



01 මෙම රූපයෙන් දැක්වෙන්නේ ........................................................................ ශාන්තිකර්මයේ මඩු සැරසිල්ලයි.

02 ඉහත දැක්වෙන මඩුව ආශ්‍රිතව පවත්වන ශාන්තිකර්මය ................................................................. නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ වේ.

03 එම ශාන්තිකර්මය පත්තිනි දේවිය හා ....................................................... දෙවියන් මුල්කරගෙන පැවැත්වූ බව සඳහන් වේ.

04 මෙම මඩුව සැරසීමේදී ගොප්කොළ, හඹරල කොළ ආදී ............................................................ අමුද්‍රව්‍යම භාවිත කිරීම විශේෂ ලක්ෂණයකි.

05 මෙවැනි ශාන්තිකර්ම පැවැත්වීමෙන් ලෙඩරෝග සුවවීම, සෞභාග්‍ය හා ..................................................... ලබාගැනීම ජනතාවගේ අපේක්ෂාව විය.

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

06 පත් හා නියද වර්ණ ගැන්වීමේ දි රතු වර්ණය සෑදීම සඳහා අතීතයේදි යොදාගත් ස්වභාවික අමුද්‍රව්‍ය වන්නේ,

(1) කොරකහ කොළය (2) පතඟි දුවය (3) වෙනිවැල් ගැටය (4) ගොකටු කිරිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

07 පිවිසුම් දොරටුව ඉදිරිපිට සංඛ නිධි හා පද්ම නිධි යන බහිරව රූප දෙක දක්නට ඇත්තේ,

(1) අභයගිරි දාගැබෙහි ය. (2) ථූපාරාම දාගැබෙහි ය.

(3) ජේතවන දාගැබෙහි ය. (4) රුවන්වැලි දාගැබෙහි ය.

08 හින්දු කෝවිල්වල ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය ලෙස සැලකෙන්නේ,

(1) මිනාර් ය. (2) ගෝපුරම් ය. (3) මිනරේට් ය. (4) කුම්භාභිෂේකම් ය.

09 ඉවතලන ද්‍රව්‍ය භාවිත කරමින් ඒවා එකට ඇලවීම, බැඳීම, පුළුස්සා රත්කර එබ්බවීම වැනි ක්‍රම භාවිතා කරමින් නිර්මාණයක් ගොඩනැගීම හඳුන්වන්නේ,

(1) ඇඹීම යනුවෙනි. (2) නෙලීම යනුවෙනි.

(3) වාත්තුකිරීම යනුවෙනි. (4) එකලස් කිරීම යනුවෙනි.

10 ඉන්දියාවේ සාංචි ස්ථූපයේ හර්මිකාව ලෙස හඳුන්වනු ලබන අංගය ශ්‍රී ලංකාවේ චෛත්‍යවල හඳුන්වනු ලබන්නේ,

(1) හතරැස් කොටුව නමිනි. (2) දේවතා කොටුව නමිනි.

(3) පේසාවලලු නමිනි. (4) සිළුමිණ නමිනි.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට A සිට E දක්වා රූපසටහන් ඇසුරුකර පිළිතුරු සපයන්න.**



A B C D E

11 A අක්ෂරයෙන් දැක්වෙන පිළිමයෙන් පිළිබිඹු වන ආසන ක්‍රමය කුමක් ද? ..........................................

12 B අක්ෂරයෙන් දැක්වෙන කඩුපුල් මල පාලි භාෂාවෙන් හඳුන්වන්නේ කුමන නමකින් ද? ..........................

13 C අක්ෂරයෙන් දැක්වෙන මස්ජිදයේ දෙපස ඇති කුළුණු හඳුන්වන නම කුමක් ද? ..........................

14 D අක්ෂරයෙන් දැක්වෙන සංකේතය දැක්වෙන ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහාව කුමක් ද?

..........................................................................................................

15 E අක්ෂරයෙන් දැක්වෙන නුවණට අධිපති දෙවියා යැයි සැලකෙන දේව රූපය හඳුන්වන නම කුමක් ද?

..........................................................................................................

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16 අඩි 17 ක් දිග බයිසන් ගව රූපය දක්නට ඇති ප්‍රංශයේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගුහාව කුමක් ද?

..........................................................................................................

17 චිත්‍රයක ළඟ රූප විශාලවටත්, ඈත රූප කුඩාවටත් ඇඳීමේ සිද්ධාන්තය හඳුන්වන්නේ කුමන නමකින් ද?

..........................................................................................................


18 නූල් රූකඩ කලාව ශ්‍රී ලංකාවේ පාරම්පරිකව පැවත එන කලාවක් වන අතර රූපවාහිනී මාධ්‍ය තුළ ජනප්‍රියම රූකඩ වර්ගය කුමක් ද? ..........................................

19 බුද්ධ ප්‍රතිමා සහ හින්දු ප්‍රතිමාවල දැක්වෙන මුද්‍රා අතර යමක් අල්ලාගෙන සිටින ආකාරය නිරූපිත මුද්‍රාව කුමක් ද? ..........................................

20 සාම්ප්‍රදායික සැරසිලි අතර එන ඉර, හඳ රූප දෙක අයත් කාණ්ඩය කුමක් ද? ..........................


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති සාම්ප්‍රදායික සැරසිලි මෝස්තරවල එන සත්ත්ව රූප හඳුනාගෙන නම් කරන්න.**

21

..........................................

22

..........................................

23

..........................................

24

..........................................

25

..........................................

- **පහත රූප සටහනේ දැක්වෙන පාරම්පරික කර්මාන්තය හඳුනාගෙන 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



26 ඉහත රූපයෙන් දැක්වෙන පාරම්පරික කර්මාන්තය නම් කරන්න. ..........................................

27 මෙම භාණ්ඩ නිර්මාණය කරන ක්‍රමවේද දෙකකි. ඉන් එකක් සඳහන් කරන්න.

..........................................

28 මෙම කර්මාන්තය ආශ්‍රිතව නිපදවන පාරිභාරික භාණ්ඩයක් සඳහන් කරන්න.

..........................................

29 මෙම කර්මාන්තය පවත්නා මහනුවර ප්‍රදේශයට අයත් ස්ථානයක් නම් කරන්න.

..........................................

30 මෙම නිර්මාණ අලංකාර කිරීම සඳහා යොදාගන්නා සිංහල සැරසිලි මෝස්තරයක් ලියන්න.

..........................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.**
- **දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් අඳින්න.**
- **ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.**

01 ආගමික උත්සවයක බැතිබර මොහොතක්

02 වන සතුන් නැරඹීමට වැව් ඉවුරක් අසලට ගියදා

03 බස් නැවතුම්පොළක හෝ දුම්රිය නැවතුම්පොළක හෝ කලබලකාරී අවස්ථාවක්

04 සාම්ප්‍රදායික සැරසිලි ඇසුරෙන් සරොම් වාටියකට සුදුසු සැරසිල්ලක් නිර්මාණය කරන්න.

05 කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක්

06 කාටූන් රූපයක් ඇසුරු කරගෙන කුඩා දරුවකුගේ ඇතිරිල්ලකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

07 සාම්ප්‍රදායික සත්ත්ව රූප ඇසුරෙන් අල්ප උන්නත කැටයමකට සුදුසු සැලසුමක්

(ලකුණු 60 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**08 ශ්‍රේණිය** **චිත්‍ර කලාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

01 පහන් මඩුව 02 සබරගමු 03 දෙවොල් 04 ස්වභාවික / දේශීය

05 සශ්‍රීකත්වය 06 පතගි දූව - 2 07 අභයගිරි දාගැබෙහිය - 1

08 ගෝපුරමය - 2 09 එකලස් කිරිම - 4 10 හතරැස් කොටුව - 1 11 භද්‍රාසනය

12 කුමුදුප්පල 13 මිනාර් 14 තන්තිරිමලේ 15 ගණදෙවි

16 ලැස්කෝ 17 පර්යාවලෝකය

18 අත් රුකඩ හෝ රිටි රුකඩ මෙම දෙකෙන් එකක් ප්‍රමාණවත් ය.

19 කටක හස්ත මුද්‍රාව 20 දිව්‍ය 21 හේරුණ්ඩ පක්ෂියා 22 ඇත්කඳ ලිහිණියා

23 ගජසිංහ 24 යාලි 25 සරපෙන්දියා 26 පිත්තල කර්මාන්තය

27 තලන වැඩ / වාත්තු වැඩ

28 ඉලත් තට්ටු / පහන් / පඩික්කම් / ගිරා / කළගෙඩි / සෙම්බු / ගුරුලේත්තු / කොතල / බන්දේසි ආදී පාරිභාරික භාණ්ඩ වලින් එකකට ලකුණු දෙන්න.

29 මහනුවර - පමුණුව / ගඩලාදෙණිය / පිළිමතලාව / කිරිවවුල / දවුලගල / නත්තරම්පොත

30 ලියවැල / අන්නාසි මල / හේරුණ්ඩ පක්ෂියා / හංස පූට්ටුව / ලියවැල් / ඉරහඳ / පලාපෙති ආදී සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර (2 x 30 = 60)

I කොටසට ලකුණු 60 යි. II කොටසට ලකුණු 40 යි. මුළු ලකුණු 100 යි.